**නායයෑම් ආපදා වැළැක්වීමේ ව්‍යාපෘතිය - 2021**

**නායයෑම් ආපදා වැලැක්වීමේ** ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය අතර 2013 මාර්තු 14 දින එළඹි අංක SL-P 109 දරණ ණය ගිවිසුමෙහි සඳහන් විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට මහාමාර්ග, වරාය සහ නාවික අමාත්‍යාංශය, වර්තමානයේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ ආයතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මධ්‍යම, ඌව සහ සබරගමුව පළාත්වල උස් බිම් ප්‍රදේශ වල සුදුසු ප්‍රතිවිරෝධතා ක්‍රියාත්මක කරමින් මූලික යටිතල පහසුකම් ලෙස ජාතික මාර්ග ඉලක්ක කර ගනිමින් නායයෑමේ ව්‍යසනයන් අවම කිරීම, එමඟින් ආර්ථික හා සමාජීය සංවර්ධනයට දායක වීම සහ මාර්ග පද්ධතියේ ආරක්ෂාව ඉහළ නැංවීම සහ මාර්ග ජාලයේ ආරක්ෂාව වැඩි කිරීම සහ මාර්ග භාවිතා කරන්නන් සහ පදිංචිකරුවන් ඇතුළු ජනතාවගේ ජීවිත සුරක්ෂිත කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රුපියල් මිලියන 16,201.2 කට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 122.6 ක් වන අතර එයින් රුපියල් මිලියන 12,870.45 කට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 97.4 ක් ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය විසින් මූල්‍යකරණය කිරීමට එකඟ විය. ඉතිරි මුදල රුපියල් මිලියන 3,331 ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යකරණය කිරීමට බලාපොරොත්තු වේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 ජූලි 05 වන දින ආරම්භ කල අතර 2020 ජූලි 05 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය තවත් වසර දෙකකින් දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්වාගණනය කළ මතය.

මගේ මතය අනුව, මගේ වාර්තාවේ 2 වගුවේ විස්තර කර ඇති කරුණුවල බලපෑම් හැර 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහයන් ගෙන් සමන්විත මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ අයුරින් පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණනය ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකරීත්වය ව්‍යාපෘතිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

ව්‍යාපෘතිය මඟින් වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණන කාලය තුළදී හඳුනාගනු ලබන අභ්‍යන්තර පාලනයේ වැදගත් අකාර්යක්ෂමතා ඇතුළුව අනෙකුත් කරුණු අතරින් වැදගත් විගණන සොයාගැනීම්, සම්බන්ධ පාර්ශවයන් සමඟ සන්නිවේදනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අදහස් දැක්වීම.**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු.**

| ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම (රු.මිලියන) | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) පිරිවැය රු. මිලියන 130.4 කට මිළට ගත් වාහන දොළහක් සහ රුපියල් මිලියන 198.8 ක වියදමින් කඩුගන්නාවේ ඉදිකරන ලද මෙහෙයුම් ගොඩනැගිල්ල 2020 ජුනි මාසයේ දී මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාර දී තිබුණි. කෙසේ නමුත්, එම වත්කම් මූල්‍ය ප්‍රකාශන වල වෙන වෙනම අනාවරණය කර නොතිබුණි. | 329.2 | කෙරීගෙන යන වැඩ වැඩියෙන් දක්වා ඇත. | එකඟ වේ. එය 2022 මූල්‍ය ප්‍රකාශන වල ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. | ඉහත සඳහන් වත්කම් මූල්‍ය ප්‍රකාශන වල වෙන වෙනම නිරූපනය කල යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 05 අනුව, මහා භාණ්ඩාගාරය විසින් 2014 වසරේ සිට 2021 දක්වා සිදු කරන ලද විදේශ විනිමය ගැලපුම් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වෙත ගෙන නොතිබුණි. | 1,353 | විදේශ ණය මුදල මූල්‍ය ප්‍රකාශන වල අඩුවෙන් දක්වා තිබුණි. | අදහස් දක්වා නොමැත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුගත විය යුතුය. |

**3. භෞතික කාර්යසාධනය.**

**3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් වල භෞතික ප්‍රගතිය.**

මෙම ව්‍යාපෘතිය A සහ B යන පැකේජ දෙකකින් සමන්විත වූ අතර, A පැකේජයට වැඩ බිම් 10 ක් සහ B පැකේජයට වැඩබිම් 06 ක් ඇතුළත් විය. ණය මුදල 2020 ජූලි 05 වන දින අවසන් වූ බැවින්, 2021 ජනවාරි 01 දින වන විට ව්‍යාපෘතිය මගින් නිමකල යුතුව තිබූ ඉතිරි වැඩ කටයුතු දේශීය අරමුදල් යොදා ගනිමින් සිදු කර තිබූ අතර 2021 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් අවසන් කර තිබුණි. කෙසේ වෙතත්, මෙම වාර්තාව නිකුත් කරන දිනය වන විටත් ඇවර කරන ලද මූල්‍ය ප්‍රකාශන ව්‍යාපෘතිය විසින් සකස් කර නොතිබුණි.